

# ශුද්ධාත්මයේ දීමනා

(The Gifts of the Holy Spirit)

- හැරී විටකර් විසිනි -

# ශුද්ධාත්මයේ දීමනා

- හැරි විටකර් විසිනි -

# පටුන


පළවෙනි පරිච්ඡේදය 3

ගැටළුව 3

බයිබල් ඉගැන්වීම් 4

දෙවන පරිච්ඡේදය 5

කැපීපෙනෙන නිදසුන් 5

නව ගිවිසුමෙන් නිදසුන් 6

මුල් සභාවට පොරොන්දුවක් 7

පෙන්තකොස්තය 8

තුන්වන පරිච්ඡේදය 9

විවිධ වර්ග වල දීමනා 9

හතරවන පරිච්ඡේදය 11

අද ශුද්ධාතම බලය ඇත්ද? 11

මුල් සභාව හා එහි ගැටළු 11

අපෝස්තුලුවරුන් මගින් පමණක් දෙනු ලැබීම. 12

අපෝස්තුලුවරුනට විශේෂයක් 12

පරම්පරා දෙකක් පමණක් 13

දීමනා මියගියේය. 13

ශුද්ධාතමය බෙදාදීම 14

සැමවිටම තාවකාලිකව 14

අන්තිම දිනවලදී 15

පස්වන පරිච්ඡේදය 16

නවීන අයිතිවාසිකම් 16

පැහැදිලි සාක්ෂි වල හිඟය 16

තවමත් දෙවියන්වහන්සේට සුවකල හැක. 17

හයවන පරිච්ඡේදය 18

ඉඳහිට 18

බොහෝ සභාවන් බොහෝ අයිතිවාසිකම් 18

සත්වන පරිච්ඡේදය 20

සාරාංශයක් 20

අටවන පරිච්ඡේදය 22

බයිබල් පරීක්ෂණයක් 22

මේ පරීක්ෂණ දෙක සඳහා නූතන ප්‍රකාශකයන් මුහුන දෙන්නේ කෙසේද? 22

උපග්‍රන්ථය - අත් තැබීම 24

ප්‍රශ්න 25

# ශුද්ධාත්මයේ දීමනා

## පළමුවැනි පරිච්ඡේදය

### ගැටළුව

මෑත වසර වල පෙන්තකෝස්ත සහා හෝ අප්‍රිකාවේ සහ සමහර අනෙකුත් රටවල ආත්ම සහා ලෙස සාමාන්‍යයෙන් නම් කරන සභාවන්හි කැපිපෙනෙන පුනරුදයක් ඇතිවී තිබේ.

මේ සභාවන් විවිධ නම් සහ ලේබල මගින් විවිධත්වය ප්‍රකාශ කරන ලදී. නමුත් මේ සියල්ලන් එක් පොදු මතයක වූහ. ඔවුන් කියා සිටින්නේ පෙන්තකෝස්ත දිනයේදී (ක්‍රියා 2) යේසුස් වහන්සේගේ ගෝලයන්ට දෙනලද ශුද්ධාත්ම පරිත්‍යාගය සත්‍ය විස්වාසකයන්ට නිතරම ලැබිය හැකි බවත් ඔවුන් අද එයින් එයින් පිරී සිටින බවත්ය. ඔවුන් සැලකුයේ මේ ආත්මික ත්‍යාගය ඔවුන් ක්‍රිස්තුස්වහන්සේගේ සේවය වෙනුවෙන් දෙවියන් වහන්සේගේ විශේෂ අශිර්වාදයේ සලකුණක් ලෙසය.

මේ ප්‍රකාශය කලේ මෘදු ලෙස හෝ පැකැලීමකින් හෝ නොව ඉතා විශ්වාසයෙන්, පාවුල් පේදුරු හා අන්අය විසින් අභ්‍යාස කල හාස්කම් සහිත අධි මානුශිය බලය සත්‍ය සභාවන්ට නිවැසියන්ට අදත් තිබෙන බවයි. මෙසේ ඔබට යම් කෙනෙක් වෙනත් භාෂා කථාකරනු ඇසීමට ආරාධනා ලබනු ඇත. නැතහොත් නිතර නොවෙතත් මෙය ආත්මික මෙහෙය වීමෙන් නොදත් භාෂා තේරුම් කිරීමයයි කල්පනා කල හැක. සමහර විට ඔබ කොතෙක් රෝගීන් හා කොරුන් මත අත් තබා ඔවුන් පුදුම ලෙස සුව වනු දැක ඇත.

වඩාත් වැදගත් වන්නේ මෙබඳු දේ ඇසීමෙන් හෝ දැකීමෙන් පසුව ශුද්ධාත්මය ක්‍රියාත්මක යයි ඔබ මේ පැහැදිලි සලකුණු මගින් නොසෙල්විය හැකි අවසන් නිගමනයකට එනු බවයි. තවත් ඒ නිසා මිනිසුන් විදහා පෙන්වන්නේ මේ අසාමාන්‍ය බලයන් සත්‍ය සභාවේ සාමාජිකයන් සඳහා ලෙසය.

# බයිබල් ඉගැන්වීම්

මේ කුඩා පොතේ පරමාර්ථය වන්නේ මේ මතය පිළිබඳ සම්පූර්ණ ප්‍රශ්ණය පරීක්‍ෂා කර බැලීමය. ඇත්තෙන්ම මේ ගැන බයිබලය කියන්නේ මොනවාද? අවසාන නිගමන වශයෙන් ඔබට දියහැකි සම්පූර්ණ බයිබල් කාරණා මේවාය.

1. මුල් සභාවට විශේෂ ත්‍යාගයන් ලෙස ශුද්ධාත්මය බලය පරිත්‍යාග කරන ලද්දේ යේසුස් වහන්සේගේ අළුත පිහිටවූ සභාවේ කටයුතු කිරීම පිණිසය.

2. මේ ත්‍යාග (සුව කිරීම් ආදිය) අනුමත වූයේ සභාවේ මුල්කාලයේ මිස සෑම කාලයටම නොවේ.

3. අද යම් කෙනෙක් ශුද්ධාත්ම බලයෙන් කටයුතු කිරීමට හැකියම් කියන විට එම ප්‍රකාශය ප්‍රතික්ෂේප කල යුතුය.

# දෙවන පරිච්ඡේදය

## කැපීපෙනෙන නිදසුන්

පළමුව, විශේෂ අවස්ථා වලදී දෙවියන්වහන්සේට සේවය කිරීමේ කටයුතු කරගෙන යාමට හැකිවීම පිණිස කලින් කලට ශුද්ධාත්මික බලය මිනිසුන්ට දෙන ලද්දේ කෙසේදැයි බයිබල් ඉතිහාසයේ දෙස ආපසු බැලීම ප්‍රයෝජනවත් විය හැක.

පැරණි ගිවිසුමේ නිදසුන් තුනක් මෙසේය.

1. බොහෝ මිනිසුන්ට ස්වභාවික ශිල්පීය දක්ෂතා දානය කළ ඇති නමුත් දෙවියන් වහන්සේ ඊශ්‍රායල්හි උන්වහන්සේගේ ශුද්ධස්ථානය ඇති කිරීමට වැඩසටහන ඇතිකල විට යුදා ගෝත්‍රයේ බෙසලීල් හට විශේෂ බලයක් දුනි.

"දක්ෂකර්මාන්ත යෝජනා කර රනින්ද, රිදීයෙන්ද, පිත්තලෙන් වැඩ කිරීමටත් බැඳීමට මැණික් කැපීමටත් ලී වලින් කැටයම් වැඩ කිරීමටත් සියළු ආකාර වැඩවල ප්‍රඥාවද, දැනගැන්මද, සියළු කර්මාන්ත වල තේරුමද, ලැබෙන ලෙස ඔහු දෙවියන් වහන්සේගේ ආත්මයෙන් පූර්ණ කලෙමි." (නික්මයාම 31:3)

2. අසාමාන්‍ය ලෙස දෙවියන් වහන්සේගේ බලය ක්‍රියාත්මක වීම සඳහා සාමාන්‍ය මිනිසුන්ටද, අති විශේෂම පාලනය සම්බන්ධ දැනුම දී ඇත.

"ස්වාමීන් වහන්සේගේ ආත්මය ඔහු වෙත පැමිණියේය. ඔහු ඊශ්‍රායල්හි විනිශ්චය කලේය." (විනිශ්චය කාරයා 6:34)

.......... බයාදු මිනිසුන් ධෛර්යයමත් කරන ලදී. එවිට ස්වාමින් වහන්සේගේ ආත්මය ගිඩියොන් කෙරෙහි පහල වූයේය. ඔහු හොරනෑවක් පිම්බේය. එවිට අබියේෂරර් වරු ඔහු ළඟට රැස්වූහ. (විනිශ්චයකාරයා 6:34)

3. බයිබලය ලිවීම සාමාන්‍ය මිනිසුන්ගේ අවශ්‍යතාව මත සිදුවූවක් නොවේ. එය ශුද්ධාත්මයේ මෙහෙය වීම හා පාලනය මගින් පැමිණියේය. දෙවියන් වහන්සේ මේ මිනිසුන්ගේ සිත් මෙහයවා ලිවූ නිසා ඒ ලේඛණ බොහෝ සෙයින් අන් ඒවාට වඩා උසස්ද, වෙනස් ද වේ.

පේතෘස් පැරණි ගිවිසුමේ අනාගත වකතෘන්ට ඔහු ලියන විට සඳහන් කරන්නේ,

"දිවැස් වාක්‍ය කිසිදින මිනිසාගේ පෙළඹ වීමෙන් නොපැමිණියේය. නමුත් දෙවියන් විසින් කියන ලදුව ශුද්ධාත්මය මගින් ඒ මිනිසුන් ක්‍රියා කෙරීන. (2 පේතෘස් 1:21) දාවිත් විසින් ලියන ලද ගිතාවලි 110 යේසුස් වහන්සේ පිළිබඳ වූ අනාගත වාක්‍යයේ මේ නිදසුන දාවිත්ම ශුද්ධාත්මයාණන් කරණකොට කථා කරමින්, මා විසින් නුඹේ සතුරව නුඹේ පාපුටුව කොට තබන තෙක් මාගේ දකුණු පැත්තේ හිඳගනින්......" (මාර්ක් 12:36)

## නව ගිවිසුමෙන් නිදසුන්

1. නව ගිවිසුමේ ප්‍රකට නිදසුන් වන්නේ යේසුස් වහන්සේගේ උපතේ හා ජිවිතයේදී සිදුවූ හාස්කම් තුළ ශුද්ධාත්මික බලය දක්නට ලැබීමය.

"දේවදූතයා ඇයට උත්තර දෙමින් ශුද්ධාත්මයාණන් වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙන සේක. මහෝත්තමයාණන්ගේ ආනුභාවයද නුඹ වසා ගන්නේය. ඒ නිසා උපදින්ට සිටින තැනැත්තේ ශුද්ධය. දෙවියන් වහන්සේගේ පුත්‍රයා යයි කියනු ලබන්නේය. (ලූක් 1:35)

2. ඔහුගේ බෞතිස්මයේදී යේසුස් වහන්සේ "දෙවියන් වහන්සේගේ ආත්මය පරවියකු මෙන් බැස එනවා ද, තමන් පිටට පැමිණෙනවාද දුටුවේය." (මතෙව් 3:16) මෙය යේසුස් වහන්සේ මේ මොහොත දක්වා නොදැන සිටි දිව්‍යමය බලය පිටතට වැගිර වීමක් විය.

"එකල යේසුස් වහන්සේ යක්ෂයා විසින් පරීක්ෂා කරනු ලබන පිණිස ආත්මයාණන් වහන්සේ විසින් වනාන්තරයට පමුණුවනු ලැබීය." (මැතිව් 4:1) පළමු පරීක්ෂාව මෙය විය.

"ඉදින් නුඹ දේව පුත්‍රයා නම් මේ ගල් රොටි වන්නට අණ කරපන්න."

පියාගෙන් ලද ශුද්ධාත්ම දානය යන්නහි අදහස යේසුස් වහන්සේ යමක් අණකල විට අති මානුෂීය බලයක් එහි ඇති බැවින් පමණක් මේ පරීක්ෂාව කල හැකි විය.

3. මෙම ශුද්ධාත්ම බලය යේසුස්වහන්සේ අපෝස්තුලුවරුනට දෙන

ලදී. යේසුස් වහන්සේගේ ධර්මදූත සේවා කාලයේ එක් අවස්ථාවක අපොස්තුලු වරුන් 12 දෙනා දෙදෙනා බැගින් දේශනා කිරීමට පිටත්කර හැරියේය.

"නුඹලා යමින් ස්වර්ග රාජ්‍යය ලංවී තිබේය කියා දේශනා කරපල්ලා රෝගීන් සුවකරපල්ලා මලවුන් නැගිටුවාපල්ලා කුෂ්ඨ රෝගීන් පිරිසිදු කරපල්ලා යක්ෂයන් දුරු කරපල්ලා (මතෙව් 10:7-8)

4. මේ සමානවම උපකාර කල 70 දෙනෙක් මෙබඳු ක්‍රියා කලහ.

"ස්වාමිනි (ඔවුන්ගේ ධර්මදූත සේවාව අවසන් වූ විට ඔවුහු කිවෝය.) ඔබගේ නාමය නිසා යක්ෂයෝ පවා අපට යටත්වෙති." (ලූක් 10:17)

මේ නිදසුන් එකකවත් සාමාන්‍ය අවස්ථාවක සිදුවීම් වලදී ශුද්ධාත්ම බලයෙන් කරන්ට දෙයක් නොවූ බවද සභාවල සාමාන්‍ය කටයුතු වලදී නොව නිතරම විශේෂ අවස්ථා හා විශේෂ කටයුතු වලදී පමණක් ශුද්ධාත්ම බලය වූ බව වටහා ගැනීම වටින්නේය.

## මුල් සභාවට පොරොන්දුවක්

යේසුස් වහන්සේ ඔහුගේ සතුරන් විසින් අල්ලා ගනු ලැබුමට පෙර අන්තිම පැය කිපයේ දී, ඔහුගේ ශිෂ්‍යයන්ට වරින්වර කියන ලද පොරොන්දුව වූ විශේෂ දිව්‍යමය බලය, උන්වහන්සේ ඔවුන්ගෙන් ඉවත් කල විට දෙන බවට පොරොන්දු විය.

"නමුත් මාගේ නාමයෙන් පියාණන් වහන්සේ එවන සැනසිලිකාරයානන් වහන්සේ එනම් ශුද්ධාත්මයාණන් වහන්සේ නුඹලාට සියල්ල උගන්වම් මා විසින් නුඹලාට කියන ලද සියල්ල නුඹලාට සිහිකරවන සේක. (යොහාන් 14:26)

මේ වචනවල විශේෂ වටිනාකමක් ඇත්තේ සුභාරංචි සතර පිළිබඳ ඒවා හොඳ ආරක්ෂණයක් බවත්, යේසුස් වහන්සේ කී කල දේ පිළිබඳ සත්‍ය වාර්තා නියම ලෙස සහතික වන නිසාය. මේවා ලියුවන්ට විශේෂ සහයෝගයක් ලෙස විශේෂ මතකයක් යේසුස් වහන්සේ ගැන හොඳ අවබෝධයක් වූයේ පැරණි ගිවිසුමේ ප්‍රොපේතවරුනට වූ සේම "ශුද්ධාත්මයාණන් මගින් මෙහෙය වූ නිසාය."

# පෙන්තකෝස්තය

යේසුස් වහන්සේ තම පොරොන්දුව ඉටුකල සේක. පෙන්තකෝස්ත දිනයේදී අපෝස්තුලුවරුනට ශුද්ධාත්ම බලය දෙනු ලැබුවේ විශාල ශබ්දයක් සමඟ ගිනි දිව වල් මෙන් පෙහිම සමඟය. (ක්‍රියා 2:2-3)

එදින සිට ඉදිරියට බොහෝ සිත්ගත් ක්‍රම මගින් ශුද්ධාත්මයේ බලය එම මිනිසුන් තුළින් පෙන්විය. ඔවුහු විවිධ භාෂා වලින් කථා කලහ. ඔවුහු මිනිසුන් පසුතැවීමට සුදුසු ක්‍රමයට දේශනා කිරීමට මෙහෙය වන ලදහ. ඔවුහු පැරණි ශුද්ධ ලියවිලි නිවැරදිව විස්තර කිරීමට මෙහෙයවන ලදහ. ඔවුහු යේසුස් වහන්සේට ගෞරවය ගෙන ඒමට පුලුවන් වන පිණිස උන්වහන්සේ කලාමෙන් සුව කිරීම් ආදී හාස්කම් කලහ. සමහර අය අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතට "ශුද්ධාත්මයේ සුභාරංචිය" යයි කිම පුදුමයක් නොවේ.

නව ගිවිසුම කියන්නේ මේ ශුද්ධාත්ම බලය අපෝස්තුලුවරුනට හැර අන්අය සඳහාද වූ බවයි. සභාව වර්ධනය වන විට එහි අන් සාමාජිකයන් හටද මේ උතුරා යන ආශිර්වාදය බෙදා ගැනීමට හැකි වූහ.

# තුන්වන පරිච්ඡේදය

## විවිධ වර්ග වල දීමනා

එක් වටිනා ශුද්ධ ලියවිල්ලක (1 කොරින්ති 12:7-10, 27-30) ආත්මික දීමනා වල දීර්ඝ ලයිස්තුවක් ඉදිරිපත් කරයි. විස්තරාත්මකව ඒවා මෙසේය.

1. **අපොස්තුලුවරු:** දොලොස්දෙනා හැර විශේෂ දූතයන් සභාවල මේ තත්වය දැරූහ. (නිදසුන පිලිප්පි 2:25, 2 කොරින්ති 8:23)

2. **දිවැස්වරු :** සමහර අය ඉදිරියේ සිදුවන දේ කීමට මෙහෙය වන ලදහ. (නිද: ක්‍රියා 11:28)

3. **ගුරුවරු:** ඔවුහු බෞතිස්මය සඳහා දේශනා කරන උපදේශකයෝ වූහ. ඔවුහු බෞතිස්මය ලැබූවන් හටද සැකයක් නැතිව උපදෙස් දුන්හ.

4. **භාස්කම් කරන්නන්:** මේ ත්‍යාගය පිළබඳ බොහෝ සෙයින් දැනගන්ට නැත. නමුත් මෙය සුව කිරීම් වලින් මෙන්ම හා නිශ්චිතව සඳහන් කර ඇත.

5. **සුව කිරීම්:** මෙය එයින්ම විස්තර වේ. පේතෘස් මේ භාස්කම මගින් කොර මිනිසා සුව කලේය. (ක්‍රියා 3) යන්න හොඳ නිදසුනකි.

6. **නුවන :** මෙය සභාව සඳහා මනා මඟපෙන්වීමකට විය.

7. **දැනුම :** ගණිතය හෝ විද්‍යාව පිළිබඳව නොව ශුද්ධ ලියවිලි වල උගන්වන් දේට අමතර දිව්‍යමය දැනුමයි. ජේසුව මේ වන විට නව ගිවිසුම ලියා නොතිබුන හෙයින් බයිබලය සම්පූර්ණ නොවීය.

8. **විශ්වාසය :** මේ දීමනාව සමහර විශ්වාසිකයන්ට තම ශක්තියෙන් බලාපොරොත්තු කර ලැබිය නොහැකි දේ උත්සහ කර සාක්ෂාත් කර ගැනීමට උපකාර කළේය. අනතුරුදායක දේශනා ගමන් වලදී යම් දේ විකුණා මුදල් ඔවුන්ගේ දුප්පත් සොයුරන්ට දීම වැනි දේය.

9. **ආත්මයන් විශේෂයෙන් දැක හඳුනා ගැනීම:** මෙය අති විශේෂ සහ අත්‍යාවශ්‍ය වූයේ වංචනිකයන්ට එරෙහිව ආරක්ෂාව සඳහාය. මිනිසුන්

ආත්මික පාලනය මඟින් කථා කරන්නේ යයි කියා සිටින විට වටහා ගැනීමේ ශක්තිය බලය හා අධිකාරිත්වය සහිතව අන් අයගේ ඉල්ලා සිටීම් ස්ථිර කිරීමට හෝ නැතැයි කීමට මේ ත්‍යාගය අවශ්‍ය විය. සභාවකට ලිපියක් ලදවිට මේ දීමනාව සහිත සහෝදරයෙක් හට මේ ලිපිය ලියා ඇත්තේ දිව්‍යමය මෙහෙය වීමෙන්ද, නැද්ද යන්න කීමට හැකිවිය.

10. **අන්‍ය භාෂාවලින් කථා කිරීම :** මේ ත්‍යාගය කුමක් විදැයි නිත්‍ය වශයෙන් කීම අපහසුය. සත්‍ය ලෙස එය නොදත් විදේශ භාෂා වලින් අතිමානුශිය ලෙස (පෙන්තකෝස්ත දිනයේදී මෙන්) කථා කිරීම හෝ පැරණි හේබ්‍රෙව් ගීත යාඥා ආදිය නැවත කීම විය හැකිය. මේ විෂය සඳහා වෙනම අධ්‍යයනයක් අවශ්‍යය. නමුත් ඇත්තෙන්ම "භාෂා" සියළු දීමනාවන්ට වඩා අඩු ප්‍රයෝජනත්වයකින් යුතු විය.

11. **භාෂා පරිවර්තනය:** මෙය සහ අන්‍ය භාෂාවලින් කථා කිරීම ලයිස්තුවේ අගට යෙදී ඇත. වෙනත් භාෂා වලින් කථා කිරීමේදී සභායක් නැතිව පරිවර්තනය නොකොට අවබෝධ කිරීම තේරුම් ගත නොහැක. එනිසා සමහර අයට මේ බලය දෙන ලදී. නමුත් පාවුල් අණ කලේ පරිවර්තනය පිළිබඳ දීමනාව ලත් කිසිවකු ළඟ නොමැති නම් වෙනත් භාෂා වලින් කථා නොකල යුතුය යනුවෙනි. ඒ දීමනාව පාලනය කලහැකි, කල යුතු විය.

# හතරවන පරිච්ඡේදය

## අද ශුද්ධාත්ම බලය ඇත්ද?

වර්තමානයේදී මෙම පෙන්තකෝස්ත දීමනා අදහන්නන් මත ඇතිදැයි ප්‍රශ්නය අසනු ලබයි. සුව කිරීම් හෝ අන්‍යභාෂා වලින් කථා කිරීමේ හැකියාවන් තමන් තුළ ඇති බැව් නිතරම පවසනු ලබත්. (පුදුමයකට වමන් අනෙකුත් දීමනා ඇති බැව් පවසන්නේ නැත.) මෙහි සත්‍යය කුමක්ද?

බයිබලය වනාහි අපගේ එකම සත්‍ය මාර්ගෝපදේශකයාය. එහි සාක්ෂි එකම නිගමනයක් කරා යොමුවෙත්. ආත්මික දීමනා යේසුස් වහන්සේ විසින් බලාපොරොත්තු වූයේ ඔහුගේ මුල් සභාවට ආධාර පිණිස මුල් වර්ෂවල පමණය. ඔවුන්ගේ කාර්යය කර අවසන්වූ පසු එම දීමනා ඉවත් කෙරිත.

## මුල් සභාව හා එහි ගැටළු

මුල් සුභාරංචි දේශකයන්ට අතිවිශේෂ දිව්‍යමය උපකාරයක් අවශ්‍යව තිබූ බව අප නොසලකා නොහැරිය යුතුය. ඔවුනට අරගල කල යුතුව තිබූ බාධා හා අපහසුකම් ගැන මොහොතක් සිතන්න.

ඔවුන්ට කිරීමට පැවරූ කටයුත්ත සඳහා පුද්ගලික මෙහෙය වීමට සහ උපදෙස් දීමට ඔවුන්ගේ ස්වාමියා තව දුරටත් ඔවුන් සමඟ නැත. ඔවුනට ප්‍රකටව පෙනෙන බලයක් හෝ ප්‍රසිද්ධියක් නොවීය. ඒ වෙනුවට ඔවුනු (අපෝස්තුලු පාවුල් හැර) සාමාන්‍ය ජනයාගෙන් අදින ලද අප්‍රසිද්ධ වූවන්ය. ඔවුනට දේව අධිසෂණයෙන් ලද නුවනක් නව ගිවිසුම පිළිබඳ නොවූයෙන් ඔවුන්ගේ උත්සාහයට මෙහෙය වීමක් නොතිබුනි. ඒ මුල් දින වලදී බයිබලයේ කොටසක් ලිවීම ඇරඹුනා පමණි.

ඔවුනට ජනප්‍රිය සහයෝගයක් හෝ ඉහල තැන්වල මිතුරන්ගෙන් සහයෝගයක් නොලැබුනි. ඒ වෙනුවට ඔවුනට සිටියේ තැන තැන විසුරුණු අළුත විස්වාසී වූ කණ්ඩායම් පමණි. ඔවුන්ගේ ජීවන ක්‍රමය මෙහෙය වීමට ස්ථාපිත කිසියම් සභාවක් නොවීය.

ඔවුනට විරුද්ධව බොහෝ විරුද්ධවාදීන් වීය. සැක සහිත වූ රෝම ආණ්ඩුකාරයින් විශේෂයෙන්ම මනාව සංවිධානය වූ දක්ෂ හා නපුරු සතුරන්ද, පරිසිවරු හා දේවමාලිගාවේ මිනිසුන්ද වූහ.

මෙබඳු විරුද්ධවාදීන්ට හා දුෂ්කරතා වලට එරෙහිව වැඩ කිරීම ඒ මුල් අපෝස්තුලුවරු ප්‍රගතියක් ලැබේ යයි බලාපොරොත්තු වන්නේ කෙසේද? දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ආත්මික බලයෙන් ඔවුන් නොපිරවූයේ නම් කෙසේද? එබඳු උපකාරයක් නොවූයේ නම් ඔවුන්ට ප්‍රමාණයට වඩා වැඩි වූ කාර්යය භාරයක් ඔවුන් කෙසේ නම් කරන්නද? කලින් සඳහන් කල පරිදි (නව ගිවිසුමේ නිදසුන් කොටස) හේතු වූ කරුණු ඉතා විශේෂ මිනිසුන්ට අමතා විශේෂයෙන් මහත් වූ කාර්යයන් සඳහා සූදානම් කරන ලදී. නමුත් වරක් ක්‍රිස්තියානි සුභාරංචිය හොඳින් එහි කටයුතු ආරම්භ කර යහපත් ප්‍රගතියක් ඇති කරගත් බැවින් දීමනාවේ අවශ්‍යතාව තවදුරටත් නොවිය. ඊලඟ පිටු කිපයේ පෙනෙන ලෙස සියළු බයිබල් කාරනා මේ ශුද්ධාත්ම ගැටලුවට ලඟා වීමට උපකාර වේ.

## අපෝස්තුලුවරුන් මගින් පමණක් දෙනු ලැබීම.

ක්‍රියා ෆොතොපහි කරුණු අනුව සාමාරියෙහි විශ්වාසීන් මත ශුද්ධාත්මය පැමිණි සැටි මේ ප්‍රශ්නය කෙරෙහි බොහෝ උපකාරී වේ.

පිලිප් (දොලොස් දෙනාගෙන් කෙනෙක්වූ පිලිප් නොවේ) උපස්ථායකයන් සත්දෙනාගෙන් කෙනෙක්වූ පිලිප්හට මහත් ඵලසහිත දේශනා සභාවක් සාමාරියේ විය. මේ ගැන ඇසූ විට යෙරුසලමේ අපෝස්තුලුවරු වහාම පේදුරු හා යොහාන් මේ හොඳ කටයුත්ත ස්ථිර කිරීමටද, අළුත් පරිවර්තකයන් මත අත් තබා ශුද්ධාත්ම දීමනාව දීමටද යැවිය.

ධර්මදූත පිලිප් මේ කාර්යය නොකලේ ඇයි ද යන්න මෙහිදී විමසා බැලීම ප්‍රයෝජනවත්ය. ඇත්තෙන්ම ඔහුට ශුද්ධාත්ම බලය තිබුනි. ඔහු විශ්වාසිකයන්ට එය නුදුන්නේ ඇයි? එය පේතෘස් හා යොහාන් මගින් දීමට අවශ්‍ය වූයේ ඇයි? බුද්ධිමත්ව කල හැකි එකම විස්තර කිරීම නම් ස්වාමීන් වහන්සේ දොලොස්දෙනා අතින් පමණක් අන් අයට ආත්මික බලය දීමට බලය දෙන ලද බැවිය.

## අපොස්තුලුවරුනට විශේෂයක්

මේ නිගමනය ස්ථිර කිරීමට, මුදල් ඉපයීම හොඳ අවස්ථාවක් ලෙස මෙය දුටු සීමියොන්, අපෝස්තුලුවරු වෙත පැමිණ මේ බලය ඔහුට දෙන්නේ නම් ඔහු හොඳින් ගෙවීමට කථා කල ප්‍රවෘත්තිය දැක්විය හැක.

"සීමොන්ද ප්‍රේරිතයන්ගේ අත්තැබීම කරණකොට ගෙන ශුද්ධාත්මය

ලැබෙන බන දැක ඔවුන් වෙතට මුදල් ගෙනවුත් යමකු පිට මට අත් තබම්ද ඔහුට ශුද්ධාත්මය ලැබෙන පිණිස මේ බලය මටත් දියල්ලා" යයි කිවේය. (ක්‍රියා 8:18-19)

සිම්යොන් මුදලට ගන්නට සිතුවේ ශුද්ධාත්මය නොවේ. ආත්මික බලයෙන් අන් අයට දෙන පුදුම සහගත දීමනාය. ඇත්තෙන්ම ඔහු මෙය හොඳ ව්‍යාපාරයක් ලෙස දිටිය. පිලිප් විසින් දැනටමත් කරන ලද හාස්කම් සලකුණු සිද්ධි ඔහු දැක තිබුනි. (ක්‍රියා 8:6-7) එසේ නම් ඔහු ඔහුගේ ව්‍යාපාරික යෝජනාව පිලිප් වෙත රැගෙන නොආයේ මන්ද? එකම සාධාරණ පිළිතුර මෙයයි. අපෝස්තුලුවරු දොලොස් දෙනාට පමණක් අන්අයට මේ බලය බෙදා දීමට ශක්තිය හා බලය දී ඇති බව සිම්යොන් වටහාගෙන සිටියේය යන්නය.

## පරම්පරා දෙකක් පමණක්

දොළොස්දෙනා නැති වී ගිය පසු, මෙම ආත්මයේ මහඟු බලයයන් අන් අය සඳහා දීමට කවුරුන්හෝ ඉතුරු නොවී සිටීම මෙය අනුසරණය කරයි. සභාව තුළ එවන් දීමනා පැවති බැව් දන්නා අන්තිම අය වනුයේ අපෝස්තුලුවරුන්ට පසු පරම්පරාව විය. ඔවුන් මිය යාමට සිටියහ. මෙම නිගමනය පළමු සභාවේ ලේඛකයෝ ස්ථිර කරත්. පළමු පරම්පරා දෙක තැනෙහි සිටි අදහන්නන් තුළ ශුද්ධාත්මයේ මෙම අපූර්ව බලයයන් පිළිබඳව මතකය තිබුනද, පසුව එය නැති විය.

## දීමනා මියගියෝය.

අපෝස්තුලු පාවුල්ගේද සාක්ෂිය මෙයයි. 1 කොරින්ති 13 හි ශුද්ධාත්මික ත්‍යාගයේ සුව කිරීම්, දැනුම, භාෂා, ආදීය පිළිබඳ දීර්ඝ පරිච්ඡේදයේ පද කිපයකින් පසු ඔහු පැහැදිලිව මෙසේ කියයි.

"අනාගත වාක්‍ය කිම් උවත් නැතිවන්නේය. භාෂා වුවත් නවතින්නේය. දැනගැන්ම නැතිවන්නේය." (1 කොරින්ති 13:8)

මේ අනුග්‍රාහිත අපොස්තුලුවරයාගේ වචනය ඒකාන්තය. අධිමානුශිය දීමනාව වන ශුද්ධාත්මය සභාවකට දෙන ලද්දේ කාලයකට පමණි. නව විශ්වාසිකයන් විශ්වාසය හොඳින් තහවුරු වන තුරු හා හොඳ ස්ථිර ක්‍රමානුකුල ක්‍රිස්තියානි විශ්වාසය සහ ජිවිතය ඇතිවන තුරු පමණි. අද මේ අභිප්‍රාය සඳහා අවශ්‍ය වන්නේ සම්පූර්ණ බයිබලය පමණි.

දැනටමත් සඳහන් කර ඇති පරිදි අපෝස්තුලුවරුන්ගේ කාලයේදී නව ගිවිසුම ක්‍රමයෙන් ඇතිවන්ට විය. අපෝස්තුලුවරු මියගිය විට සභා කිපයක පමණක් නව ගිවිසුමේ සම්පූර්ණ පිටපත් තිබින.

## ශුද්ධාත්මය බෙදාදීම

අපෝස්තුලුවරු මගින් පමණක් දෙන ලද යන සිරස යටතේ කලින් අදහස් කලේ අපෝස්තුලුවරු හැර වෙනත් කිසි මිනිසෙක්ට මේ බලය අන් අයට දීමට නොහැකි බව පෙන්වීමටය.

නමුත් ඇත්තෙන්ම "ආත්මය" ලබන වෙනත් ක්‍රමද විය. එය කෙලින්ම ස්වර්ගයෙන් ලබා ගැනිමය. නමුත් මෙය ඉතා විශේෂිතය. නිදසුන් හතරක් පමණක් සඳහන් වේ.

1. අපේ ස්වාමින් වහන්සේ ඔහුගේ බෞතිස්මයේදී (මතෙව් 3:16)
2. පෙන්තකෝස්තයේදී (ක්‍රියා 2:1-4)
3. සොලවන ලද නිවස තුළ රැස්වීමේදී (ක්‍රියා 4:31)
4. පළමු අන්‍ය ජාතික ආගම පිළිගත් කොර්නේලියස්ගේ ගෘහය (ක්‍රියා 10:44)

අද ශුද්ධාත්ම දීමනා ලබා ඇතැයි කියන අය පහත සඳහන් ලෙස ලැබිය යුතු වේ. එක්කෝ කෙලින්ම ස්වර්ගයෙන් හෝ අපෝස්තුලුවරු අත් තැබීමෙන් හෝ ලැබිය යුතුය. මෙහි පළමුවැන්න විශේෂිතය. එය නව ගිවිසුම යුගයේද එසේය. දෙවැන්න අපෝස්තුලු වරුන්ගේ මරණයෙන් පසුව තවදුරටත් නැත. අද ඔවුන් සතුව මේ බලය තිබේ යයි කියන අයට මෙහි දුශ්කර කරුණක් තිබේ. ඔවුහු ශුද්ධාත්මය ලැබුනේ යයි කියන්නේ කෙසේද?

## සෑමවිටම තාවකාලිකව

දෙවියන්වහන්සේ කලින් සියළු කාලවල ආත්මික බලය මිනිසුන්ට දුන්නා නම් එහි වටිනා කමක් නැත, එය කෙටි කලකට පමණක් විශේෂ බලාපොරොත්තුවකට දෙන ලදී.

ආත්ම ආශිර්වාද ලත් 70 දෙනෙකුගෙන් යුත් ඊශ්‍රායෙල් වැඩිහිටි පිරිසක් මෝසෙස්ට ඔහුගේ කටයුතු වල උපකාර පිණිස විය. (ගණන් කථාව 11:24-30) නමුත් ඔහුට පසුව සිටි යෝෂුවාට එසේ නොවිය.

සාමුවෙල් විසින් ආලේපිත සාවුල් අනාගත වාක්‍ය කිවේය. (1 සාමුවෙල් 10:9-13) නමුත් පසුව **ඒ ආත්මික බලය ස්වාමින් වහන්සේ කෙරෙන්** දුෂ්ඨාත්මයක් මගින් ඉවත් කෙරින. (1 සාමුවෙල් 16:14) යේසුස් වහන්සේ උන්වහන්සේගේ සේවා කාලයේදී 12 දෙනාට මෙම ශුද්ධාත්ස බලය දී දේශනා කිරීමට පිටත යවන ලදී. (මාර්ක් 6:7-13) නමුත් ටික කලකය පසු ඔවුන්ගෙන් නව දෙනෙකුට අපස්මාරයෙන් පෙලුන ළමයකු සුවකල නොහැකි විය. (මාර්ක් 9:7, 18, 28, 29)

## අන්තිම දින වල

අන්තිම දිනවලදී ශුද්ධාත්ම බලය එළිදරව් වීමක් සිදුවන්නේ යැයි බයිබලය පවසන බැව් කියනු ලබත්.

ඇත්තෙන්ම මෙම ප්‍රකාශය නිවැරදිය. නමුත් අද ශුද්ධාත්ම බලය යොදාගන්නේ යැයි පවසන අය එම ශුද්ධ ලියවිලි පද වැරදි ලෙස යොදා ගනිමින් විකෘති ආදේශයක් කරත්.

"ඉන්පසු මාංසමය වූ සියල්ලන් කෙරෙහි මාගේ ආත්මය වගුරුවන්නෙමි. නුඹලාගේ පුත්‍රයෝද දූවරුද අනාගත වාක්‍ය කියන්නෝය. නුඹලාගේ මහල්ලෝ ස්වප්න දකින්නේය. යෞවනයන්ට දර්ශන පෙනෙනවා ඇත. (යොවෙල් 2:28)

පෙන්තකෝස්ත දිනයේදී පේතෘස් මේ අනාවැකිය විස්තර කරමින් (ක්‍රියා 2:17) ඔහුගේ කාලයේ යෙරුසලමේ වැසි යුදෙව්වන්ට ඔවුන් මේ වෙත යොමු කරමින්, මේ පෙනෙන ලෙස අනාගතයේදී වැඩි දුරටත් මේ අනාවැකිය සම්පූර්ණවන්ට ඕනැයි කිය. වියහැකි පරිදි යෙරුසලම් වැසියන් කෙරෙහි ආශිර්වාදයක් වේ. යෝවෙල්හි පේදය ජෙරුසලමේ සියෝන් කන්ද ගැන විශේෂයන් සඳහන් කරන අතර (යෝවෙල් 2:32) එය අන්‍ය ජාතින්ටද පළමු සියවසේදී මෙන් ශුද්ධාත්ම දිමනාව ලැබෙනු ඇත. මේ ශුද්ධ ලියවිල්ල අද කාලයේ කටයුතු පිළිබඳ සැලකිය යුතු තරම් සැකයක් ඇති කරයි. එහි ආරම්භය සියලු තන්හි මිස යෙරුසලමේ සියොන් කන්දෙන් නොවේ.

# පස්වන පරිච්ඡේදය

## නවීන අයිතිවාසිකම්

සියළු සැකයන් ඇති වන්නේ ශුද්ධාත්මය පිළිබඳව නවීන අයිතිවාසිකම් කියා පෑමෙනි.

ශුද්ධාත්ම බලයෙන් සුව කිරීම් හා භාෂා වලින් කථා කිරීම පමණක් බොහෝ සේ කියා සිටින දෙයක්ව ඇත්තේ ඇයි? කිසි දිනක අනාවැකි කීම හෝ ආත්මයන් පැහැදිලිව දැකීම නොකියති. (තුන්වන පරිච්ඡේදයේ 9 වන ඡේදය බලන්න.)

"අන්‍ය භාෂා වලින්" කථා කිරීමේදී අර්ථකථන දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වාර්ථා වී ඇති අවස්ථා ඇත. වංචාව එළිදැකීම සඳහා ආත්ම විචක්ෂණය කරන නොමැත !

සර්ප දෂ්ඨ කිරීම් හෝ විස වල ශුද්ධාත්ම ප්‍රතිශක්ති ප්‍රදර්නය කිරීමේ නූතන උත්සාහයයන් තිබූ බැව් සැබෑවකි. නමුත් ඒ සියල්ල කෙලවර වූයේ මහත් විපතිනි. මෙවැනි අයිතිවාසිකම් සහ අසාර්ථක වීම් තුළින් අප පැමිණිය යුත්තේ කෙබඳු නිගමනයන් වලටද?

## පැහැදිලි සාක්ෂිවල හිඟය

නැවත, නිතරම භාස්කම් මගින් සුවකිරීම ග්‍රස්තික හෝ මානසික ආබාධ තත්වයන්ට පමණක් සම්බන්ධව පවතින්නේ ඇයි? නිතරම මානසික තත්වය ශරීරයට බලපෑම් කරන නැතිනම් නොපැහැදිලි අභ්‍යන්තර ශාරීරික අසනිප මත බලපවත්වන්නේ ඇයි?

නිදසුනක් වශයෙන් ගුප්ත අභ්‍යන්තර වේදනාවන් අත්තැබීමෙන් නැතිව යන්නේ හෝ සන්ධි ඉදිමීම වැනි වේදනා ඇඟිලි වලින් ඇතිල්ලීම මිරිකීම මගින් නැතිවේ. ඒ අවස්ථාවන් වලදී සුවය ලැබීමට අසනිප පුද්ගලයන් මොනතරම් හදිසි නිගමන වලට පැමිණෙත්ද? සැලකිල්ලට ගත යුත්තේ සන්ධි ඉදිමීම වැනි රෝග සුවවී යයි සිතුවද එය නැවතත් හටගන්නා බවයි. ඇත්තෙන්ම ශුද්ධාත්මයට සම්පූර්ණයෙන්ම හොඳට සුවකල හැකිද?

කැඩුන කකුලක් හෝ අප්‍රාණික අතක් සහිත මිනිසෙක් ක්ෂණිකව

ඔහුගේ ඇදය දිගහැර සුවවීමක් හෝ පිළිකුල් සහගත ලාදුරු රෝගය ක්ෂණයකින් සුවකිරීමක් හෝ ඇද්ද?

මේවර්ගයේ ස්ථිර කල එක සිද්ධියක් අවිශ්වාසය සම්පූර්ණයෙන්ම සදහටම තුරන් කරනු ඇත.

## තවමත් දෙවියන්වහන්සේට සුව කල හැක.

මේ කාරණයේදී සමහර කියවන්නන් මෙසේ සිතනු ඇත. "මෙය අදහස් කරන්නේ අද කාලයේ දිව්‍ය බලයෙන් සුව කිරීමක් කල නොහැකි බවද? එබඳු ආශිර්වාදයක් සදහටම නැති වී ගියේද?

මේ ප්‍රශ්නයට සාමාන්‍ය හා නිසැක පිළිතුර නම්, දෙවියන් වහන්සේ සෑම කල්හිම විශ්වාසී යාඥා ඇසීමට කැමති අතර නිතරම (සෑමවිටම නොවේ) උපකාර වශයෙන් කාරුණිකව භක්තිමත් වචනයට ප්‍රතිඋත්තර දෙන බවය.

දාවිත් යෝබ් හෙසකියා හා ඉපප්‍රොඩිටස් වැනි මිනිසුන් බරපතල අසනීප වලින් සුවකර ඇත ඔවුන් මත අත් තැබීමට දිව්‍යමය මිනිසකු ශුද්ධාත්ම බලයෙන් ඔවුන් සුව කිරීමට නොපැමිණියේය. එබඳු දේ අදත් සිදුවිය හැක. ස්වර්ගීය පියාණන් ඔහුගේ දරුවන්ගේ ආපදා වලදී ඔවුන්ගේ යාච්ඤා අසන්ට නිතරම සූදානම්ය. නමුත් අප නිතරම කරන මේ යාඥා දෙවියන් වහන්සේ පිළිගෙන අපට පිළිතුරු දේ යන්න මින් අදහස් නොකෙරේ. අපෝස්තුලු පාවුල් ස්වාමින් වහන්සේගේ සේවාකටයුතු වලදී මහත් සේ බාධා ඇතිකල තද අමාරුවක් ඔහු හැඳින්වූයේ "මාංසයේ කටුවක්" යනුවෙනි. ඔහු තුන්වරක් එය ඉවත් වී යන්නෙ යයි සිතා යාච්ඤා කලේය. (2 කොරින්ති 12:7-8) නමුත් පිළිතුර වූයේ "නැත" යනුයි. මේ ජේදය විස්තර කෙරෙන පරිදි දෙවියන් වහන්සේ පාවුල්ට ඒ තත්වය හොඳ බව දැනසිටි සේක.

# හයවන පරිච්ඡේදය

## ඉඳහිට

දිව්‍යමය සුව කිරීම (දෙවියන් වහන්සේට යාච්ඤා කිරීමෙම් ප්‍රතිඵලයක් වශයෙන් ලැබුන) හා ආත්මික දීමනා අභ්‍යාස කිරීම් මගින් (ස්වාමීන් වහන්සේගේ සේවකයෙක් මගින් සුව කිරීම) අතර වෙනස පැහැදිලිව මතක තබා ගැනීම වැදගත්ය.

නිදසුනක් වශයෙන් පේදුරු දේව මාලිගයේ දොරටුව ලඟදී කොර මිනිසකු සුව කිරීම කල්පනා කරන්න. (ක්‍රියා 3:1-10) මේ මොහොතේ අද අපට තිබෙන කිසිඳු සැක සහිත බවක්, දෙවියන් වහන්සේ ක්ෂණික සුව කිරීම් බලය සහිතද යන්න පිළිබඳව නැත. සුව කිරීමට බලට දැනටමත් පේදුරු යතුව තිබුන. ඔහුගේ කැමැත්ත අනුව එය පාවිච්චි කිරීම හෝ නොකිරීම විය. මෙහි දේව මාළිගයේ දොරටුව අසලදී ඔහුගේ බලය ක්‍රියාත්මක කළේය. මෙහොතකින් මිනිසා සුවය ලැබිය. ඔහුගේ ජිවිතයේ කිසි දිනක නොලත් සේ ඇවිදිමින් පනිමින් සිටියේය.

අද ආත්මික දීමනාවෙන් සුව කරන්නේ යයි කියන්නන් මෙබඳු ප්‍රතිඵල පෙන්විය යුතුය. නමුත් ඔවුනට හැකිද?

අද කාලයේ නිතරම පෙන්තකෝස්තික සුව කරන්නන් කියා සිටින්නේ ඔවුන්ගේ බලය ක්‍රියාත්මක වීමට පෙර විශ්වාසය අවශ්‍ය බවයි. මෙය පේතෘස් කොර මිනිසා සුව කිරීමට වඩා කොරතම් වෙනස්ද? නැතහොත් දොර්කස් නැවත ජිවිතයට නැගිටුවීම (ක්‍රියා 9:36-41) හෝ සමාජියයන් අතරෙහි පිලිප් කල හාස්කම් (ක්‍රියා 18:7) හෝ පාවුල් පිලිප්පියෙහි උමතු තරුණිය සුව කිරීම (ක්‍රියා 16:16-18) හෝ තෙවන මහලේ ජනේලයෙන් වැටුන යුතිකස් නැගිටුවීම කොතරම් වෙනස්ද? (ක්‍රියා 20:9-12)

## බොහෝ සභාවන් - බොහෝ අයිතිවාසිකම්

මේ දුෂ්කර කාරණයේදී අවසන් වශයෙන්, සෑම සභාවක්ම ශුද්ධාත්මය ඇතැයි බයිබලයට අයත් නැති ක්‍රමයක ඉගැන්වීම හෝ වෙනත් ඉගැන්වීම් ඉදිරිපත් කරන්නේ ඇයි? ඇත්තෙන්ම ශුද්ධාත්මය මේ සභා තුළ ක්‍රියාත්මකව පවති නම් සම්පුණ වශයෙන් ඒ සභාවේ ඉගැන්වීම් හා බයිබල් ඉගැන්වීම් සඳහා ශුද්ධාත්මය ස්වාමීන් වහන්සේ විසින් දෙන ලදැයි විශ්වාස

එකඟතාවයක් තිබිය යුතුය. නැවත නැවතත් පෙන්තකෝස් සභාවන් පරීක්ෂණය කරනු ලබන විට දේව වචනය මූලික සත්‍ය සමඟ එකඟ වී නොමැති බැව් පෙනේ.

මෙය අපෝස්තුලු යොහාන් ප්‍රකාශ කරන පරීක්ෂා කිරීමේ ක්‍රමයකි.

"බොහෝ බොරු ප්‍රොපේතවරු ලෝකයට පැමිණ සිටින නිසා සියළුම ආත්ම විශ්වාස නොකොට ඒ ආත්ම දෙවියන් වහන්සේගේදැයි පරීක්ෂා කරපල්ලා මෙයින් නුඹලා දෙවියන්වහන්සේගේ ආත්මයානන් වහන්සේ දැනගන්නහුය. එනම් යේසුස්වහන්සේ මාංශයෙන් යුක්තව ආ බව ඒත්තු ගන්නා වූ සියළු ආත්මයෝ දෙවියන් වහන්සේගෙන්ය. යේසුස්වහන්සේ ඒත්තු නොගන්නාවූ සියලු ආත්මයෝ දෙවියන්වහන්සේගෙන් නොවෙති." (1 යොහන් 4:1-3)

ලියන්නාට මෙය මෙසේ කීම සතුටම කරුණු නොවන මුත්, සත්‍යයට මුහුණ දිය යුතුය. ඉතාමත් සැලකිල්ලෙන් එක් පෙන්තකෝස්ත සභාවකට පසුව අනෙක පරීක්ෂා කර බැලිමේදී කණගාටුවට කරුනක් වන්නේ ඔවුන්ගේ ශුද්ධාත්මයෙන් මෙහෙය වනු ලබන්නේ යයි කීම ආගම විශ්වාස කරන්නන් විසින් බයිබලයේ ඉගැන්වීම් වලට වඩා බොහෝ වෙනස්ව මිනිසුන් විසින් ඇති කරන ලද්දක් බවය. මෙය ඉතා අඩු තරමින් අපට පරිස්සම් වීමට උගන්වයි.

එක් පෙන්තකෝස්ත හිතවතෙක් ඉමහත් අවධාරණයකින් කීවේ ඔහුගේ විශ්වාසය සත්‍ය විශ්වාසිකයන්ගේ ආත්මය මරණයේදී යේසුස් වහන්සේ සමඟ සදාකාලිකව සිටීමට ස්වර්ගයට යන බවයි. (යොහාන් 3:13, 1 කොරින්ති 15:23, හෙබ්‍රෙව් 11:39-40, සිය ගණනක් තවත් පද වලට එරෙහිව) ඔහුගේ උපදේශකයන් ඔහුට කිසි දිනක නැවත නැගිටීම හා අන්තිම දිනයේ විනිශ්චය උගන්වා නැත. (මේ වැදගත් කාරණය පිළිබඳ බයිබලය කියන්නේ කුමක්දැයි මෙහි පසුපස පිටකවරයේ ඇති ලිපිනයට ලියා මේ කරුණට අදාල තවත් පොත් ලබා ගත හැක.)

# සත්වන පරිච්ඡේදය

## සාරාංශයක්

(අ) සුව කිරීම්, භාෂාවන් කථා කිරීම ආදිය ගැන පෙන්තකෝස්ත සභාව කියන කරුණු ප්‍රමාණවත් නැත. (4 වන පරිච්ඡේදය බලන්න.)

(ආ) විශ්වාසීන්ගේ පළමු පරම්පරාව සමඟ ශුද්ධාත්ම දීමනාද නැතිව ගිය බව විශ්වාස කිරීමට හොඳ බයිබල් කාරණා තිබේ. (<u>පරම්පරා දෙකක් පමණයි.</u> කොටස බලන්න.)

(ඇ) ශුද්ධාත්ම දීමනා ඇතැයි කියන්නෝ ශුද්ධ ලියවිලි වල නොමැති දේ විශ්වාස කිරීම හා උගැන්වීම කරති.

(ඈ) "ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ල කෙරෙනකොට ගෙන ගැලවීම පිණිස නුඹ නැනවත් කරන්ට පුළුවන් වූ ශුද්ධ ලියවිලි, (2 තිමොති 3:15) ඒ නිසා ඒ සඳහා ශුද්ධාත්මය අවශ්‍යතාවක් අද නැත.

මේ වචන කියවන සමහරුන් හට ශුද්ධාත්මය ක්‍රිස්තියානි ජීවිතයේ අත්දැකීම් වලින් නිදහස් කිරීමට ප්‍රයත්නයක් දරණුසේ පෙනෙනු ඇත. එබඳු නිගමනයක් බරපතල වරදවා ගැනීමක් වේ. ඇත්තෙන්ම ශුද්ධාත්මයෙන් ක්‍රියාකාරකම් වැනි දේවල් දෙවියන් වහන්සේගේ ලෝකයේ ඇත. විශේෂයෙන්ම ඔහුගේ විශ්වාසී මිනිසුන් අතරය.

එසේ නොවන්නේ නම් පාවුල් යාච්ඤා කරන විට අදහස් කලේ කුමක්ද?

"ඉදින් ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් නුඹලා අධික බලාපොරොත්තුවෙන් සිටින පිණිස බලාපොරොත්තුවේ දෙවියන් වහන්සේ ඇදහිල්ලෙන් වූ සියළු ප්‍රීතියෙන් සමාදානයෙන්ද නුඹලා සම්පූර්ණ කරන සේක්වා." (රෝම 15:13)

මෙහි ශුද්ධාත්මය යනු විශ්වාසිකයාගේ ජීවිතය තුළ විවිධ වූ දිව්‍යමය බලයකි. ප්‍රීතිය දීම, බලාපොරොත්තු, සාමය භාස්කම් නොවේ.

නමුත් පාවුල් පසුව ලිවූ පද කිපයකින් ඉතා පැහැදිලි විස්තරයක් කරයි.

"ක්‍රිස්තුස්වහන්සේ විසින් මා කරන කොට ගෙන කරවන ලද කාරනා මිස අන් කිසිවක් ගැන කථා කරන්ට සිතටවත් නොගනිමි. එසේම යෙරුසලම පටන් ඉල්ලුරිකය දක්වා අවට රටවල යේසුස් වහන්සේගේ සුභාරංචිය සම්පූර්ණ වශයෙන් දේශනා කළෙමි." (රෝම 15:19)

අද තවමත් අපට ශුද්ධාත්මය බලාපොරොත්තුව දෙන බවට අත්දැකීම් ලැබිය හැක. (13 පදය) නමුත් සත්‍ය වන්නේ කිසිවෙක් හට නියතව ලකුණු හා පුදුමවල බලය (19 පදය) නොමැති වීමය. පාවුල්ගේ ජීවිත කාලයේ විදහා පෙන්වන ලද දේ ක්‍රියා පොතේ වාර්තා ඇත.

අද පැහැදිලිව සම්පූර්ණ ලෙස ශුද්ධාත්ම මෙහෙය වීමෙන් උපකාර ලැබිය හැක්කේ බයිබලය මගින් බව වටහා ගැනීම වැදගත් වේ. එය මේ කුඩා පොතෙහි (දෙවන පරිච්ඡේදය බලන්න.) පෙන්වා ඇත්තේ. පැරණි ගිවිසුමේ ශුද්ධ ලියවිලි හා සුභාරංචිය අපෝස්තුලුවරුන්ගේ ලිපි ඇතුලත් නව ගිවිසුම සියල්ල යොමු කිරීම හා පාලනය ශුද්ධාත්මය විසින් කරන ලද මිනිසුන් විසින් ලියැවූ බවය.

දෙවියන්වහන්සේගේ මෙහෙය වීමෙන් ලියන ලද මේ බයිබලයේ හොඳ, වඩාත් රැඳී පවතින ශුද්ධාත්ම බලයේ උපකාරය පවතී.

"ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණ කොටගෙන ගැළවීම පිණිස නුඹ නැනවත් කරන්නට පුළුවන." (2 තිමොති 3:15) ඒ නිසා අද නිසැකවම මිනිසකු බයිබලය හා කියවීමේ කැමැත්ත ලැබීමට උත්සහවන්තව යාච්ඤාකර අවබෝධ කර ගැනීමේ උපකාර ඉල්ලන්නේනම් ඔහු ඔහුගේ ජීවිතය යේසුස්වහන්සේ තුළට ලඟාවීමට අවශ්‍ය සියලූ මාර්ග ලැබෙන්නේය. ශුද්ධාත්මයේ ප්‍රාතිහාර්යාත්මක දීමනා අවශ්‍ය නැත. මෙම බලයයන් සතු යැයි පවසන සහා දෝෂ සහිතය.

ආත්මයේ ඵලය වන "ආදරය සතුට, සාමය, ඉවසීම, කාරුණිකකම, යහපත්කම, විශ්වාසවන්තකම, ආචාරශීලිකම හා ආත්මදමනය (ගලාති 5:22-23) සියලූම යේසුස් වහන්සේගේ ශිෂ්‍යයන්ගේ අදහස හා අරමුණ විය යුතුය. ආත්මයේ දීමනා අවශ්‍ය නැත. ඇත්තෙන්ම තවදුරටත් එය අප සමඟ නැත. යේසුස් වහන්සේ නැවත එනතුරු ඇතිවන්නේත් නැත.

# අටවන පරිච්ඡේදය

## බයිබල් පරීක්ෂණයක්

දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයේ අධිකාරිය ඇතිව කථා කරන අය පිළිබඳව ඉශ්‍රායෙල් සෙනඟ සතුවිය යුතු ආකල්පය ද්විතිය කථාව පොතේ සඳහන්ව ඇත.

පළමුව, අනාගත වක්තෘන් කථාකල අනාවැකි ඒවායේ සම්පූර්ණ වීම සත්‍ය යයි ඔප්පු කල හැකි විද?

**"අනාගත වක්තෘ ස්වාමීන් වහන්සේගේ නාමයෙන් කථා කරනදේ ඉෂ්ඨ නොවන්නේ නම් ඒ වනාහි ස්වාමීන් වහන්සේ නොකී කාරණය. එය අනාගත වක්තෘ තෙමේ හිතුවක්කාර කමින් කිවේය."** එය දෙවියන්ගේ බලය නෙමතැවය. (ද්විතිය කථාව 18:22)

නමුත් නිතරම මෙබඳු ඊනියා "අනාගත වක්තෘ" වරු අනුමාන පැවසීම තුළින් ඔහුගේ අසන්නන් රැවටිය හැක. එනිසා තව දුරටත් පරීක්ෂා කරනු ලැබිය.

**"නුඹලා අතරෙහි අනාගත වක්තෘ කෙනෙක්වත් ස්වප්න කාරයෙක්වත් නැගිට නුඹ දැන නොගත් අන් දෙවිවරුන් අනුව අපි ගොස් ඔවුන්ට සේවය කරමුයි. ලකුණක් හෝ ආශ්චර්යයක් නියම කල කල්හි. ඔහු නුඹට කී ලකුණත් ආශ්චර්යයක් සිදු උනත් ඒ අනාගත වක්තෘගේ වචන වලටත් ස්වප්න කාරයාගේ වචන වලටත් කන් නොදෙන්න.** (ද්විතිය කථාව 13:1-2) වෙනත් වචනයකින් කිවහොත්, අනාගත වාක්‍යය හෝ සලකුණක් හෝ පුදුම සහගත දෙයක් ශුද්ධාත්මයේ ක්‍රියාවක් යයි සහතිකයක් නැත. අවසාන හා ස්ථිර පරීක්ෂණය නම් උගැන්වීම හොඳද සත්‍යද නිවැරදිද යන්නයි.

## මේ පරීක්ෂණ දෙක සඳහා නූතන ප්‍රකාශකයන් මුහුණ දෙන්නේ කසේද?

එහෙයින් පලමු පරීක්ෂණයේදී, නූතන කියා සිටින්නන් ශුද්ධාත්ම බලයෙන් නිවැරදි අනාවැකි කියන්නේද? බොහෝ විට සුව කිරීම් හා භාෂා වලින් කථා කිරීම ඇත. නමුත් කිසිකෙනෙක් කවදාහෝ නිවැරදි දත්තයන්ගෙන් යුත් පෙන්තකෝස්ත අනාවැකියක්, මාසයකින් සිදුවන කරුණක් හෝ වරසකින්

සිදුවන්නක් කීවේ කවදාද? (යෙසායා හෝ යෙරමියා නැවත නැවතත් කියූ වර්ගයේ) ?

ඊළඟට දෙවන පරීක්ෂණ සඳහා, අපට පෙන්තකෝස්ත අනාවැකි සම්පූර්ණ වූ දෙයක් පිළිබඳ පැහැදිලි නිදසුනක් සොයාගත හැකි වුවත් පෙන්තකෝස්ත කටයුතු පිළිබඳ ඉගැන්වීම් බයිබල් ඉගැන්වීම් හා එකඟ වේද? දැනටමත් පෙන්වූ පරිදි (හයවන පරිච්ඡේදය) යමෙක් ශුද්ධාත්ම බලය නොඅඩු බව ලැබේ යයි කියන්නේද, එක් වැදගත් කරුණකින් හෝ අනෙකකින් බයිබල් සත්‍ය නොමඟ යනු නිතරම හමුවේ.

ඉදින් ඔබට ගැනිමට ඇති නිගමනය කුමක්ද? පෙන්තකෝස්ත ක්‍රියාකාරකම් මෝසෙස් විසින් දෙන ලද පරීක්ෂණ දෙකෙන්ම අසමත්ය.

- හැරී විටකර් -

# උපග්‍රන්ථය

## අත් තැබීම

අත් තැබීම පිළිබඳ නව ගිවිසුමේ විවිධ නිදසුන් මෙහි සාරාංශ කොට දැක්වීම ප්‍රයෝජනවත් විය හැක.

1. සුව කිරීම් සඳහා

   (අ) අප ස්වාමීන්වහන්සේගේ හාස්කම් (මාර්ක් 6:5 , ලූක් 4:40)

   (ආ) අනානියස් පාවුල්ගේ අන්ධබව සුව කිරීම (ක්‍රියා 9:12)

   (ඇ) රෝගී මිනිසකු පාවුල් සුව කිරීම (ක්‍රියා 28:8)

2. දිව්‍ය ආශිර්වාදය සඳහා

   යේසුස් වහන්සේ කුඩා දරුවන් ආශිර්වාද කිරීම (මතෙව් 9:13-15)

3. සභාවේ විශේෂ කටයුතු සඳහා

   (අ) උපස්ථායකයන් සත්දෙනා (ක්‍රියා 6:6)

   (ආ) බර්නබස් හා පාවුල්ගේ ධර්මදූත සේවය (ක්‍රියා 13:3)

4. ශුද්ධාත්මය බෙදා දීමට

   (අ) සමාරිය විශ්වාසීන්ට (ක්‍රියා 8:17-19)

   (ආ) තිමොතිට (1 තිමොති 4:14, 2 තිමොති 1:6)

අන්තිම ජේදයේ පැහැදිලි කරන්නේ (4 පරිච්ජේදය) පෙන්වන ලද කරුණු වලින් අපෝස්තුලුවරු පමණක් අන් අයට ශුද්ධාත්ම බලය දීමට හැකිකම තිබූ බවයි. පළමුව දැකීමේදී 1 තිමොති 4:14 වැඩි මනක් ලෙස පෙනේ. නමුත් 2 තිමොති 1:6 ඒ අවස්ථාවම සඳහන් කරමින්, එහිදී අපෝස්තුලු පාවුල් ඒ උත්සවයට සහභාගි වූ බව කියයි. එවිට අනික් වැඩිහිටියන් ඇතුලත් වූයේ විශේෂ ධර්මදූත කටයුත්තක් සඳහා තිමොති පාවුල් සමඟ පිටතට යෑමට තිබූ හෙයිනි. (එයද 3 වන කොටසේ මෙන්ම 4 වන කොටසේද එයි.)

## මේ පොත කියවීමෙන් පසු ඔබට පිළිතුරු දීම සඳහා ප්‍රශ්න :-

### ශුද්ධාත්ම දීමනා

1. පැරණි ගිවිසුමෙන් ශුද්ධාත්ම දීමනා පිලිබඳ නිදසුනක් දෙන්න.
2. දෙවියන්වහන්සේගේ ආත්මය බයිබලය ලිවීමේදී කල කොටස කුමක්ද?
3. මුල් සභාව කාලයේ ශුද්ධාත්ම දීමනා පැවතුනේ මන්ද?
4. මුල් සභාවට ශුද්ධාත්ම දීමනා දුන්නේ කෙසේද?
5. දීමනා අන්අයට දුන්නේ කෙසේද? කවදාද?
6. පාවුල් සඳහන් කල සමහර දීමනා නම් කරන්න. (සුව කිරීම් හා භාෂා හැර)
7. අද ශුද්ධාත්මය ඇතැයි කියන අයට බයිබලයෙන් කුමන පරීක්ෂණයක් නිර්දේශ කිරීමට අපට හැකිද?
8. අන්තිම දින ගැන යෝවෙල්ගේ අනාවැකිය කුමක්ද?
9. බයිබලයේ අත්තැබීම කුමක් සඳහා යොදා ගැනිනිද?
10. ආත්මයේ ඵලය කුමක්ද?

කරුණාකර ඔබේ පිළිතුරු පැහැදිලි අත්අකුරින් පසු කවරයේ ලිපිනයට එවන්න.